චක්‍රලේඛ අංක : 03/2022

WPCEC/MA 01/ චක්‍රලේඛ
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 628 ,
ජනපය සිටි ගොඩනැගිල්ල,
8 වන මහල , නාවල පාර ,
රාජගිරිය.
2022.03.04

බස්නාහිර පළාතේ,
සියළුම වි.සේ.ස. සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්,
සමූපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල හා
අනෙකුත් සියළුම ලියාපදිංචි සමූපකාර සමිති සභාපතිවරුන් වෙත.

<u>යතුරු ලේඛක තනතුරේ සමූපකාර සේවකයන් කළමනාකරණ සහකාර තනතුරට අන්තර්ග්‍රහණය කිරීම.</u>

බස්නාහිර පළාත් සමූපකාර ක්ෂේත්‍රයේ ඇතැම් සමිති වලට අයත් දැනට ක්‍රියාත්මක පිරිස්බල තක්සේරු වල 104:9 වැටුප් පරිමාණයේ කළමනාකරණ සහකාර තනතුරු හා එම වැටුප් පරිමාණයට අයත් යතුරු ලේඛක තනතුරු පවතින බවත්, එම තනතුරු වල පිහිටවූ සේවකයන් සේවය කරන බවත් කොමිෂන් සභාවට නිරීක්ෂණය වී ඇත.

02. යතුරු ලේඛක තනතුර මේ වන විට අභාවිත තනතුරක් වන බැවින්, සමූපකාර ආයතන තම පිරිස් බල තක්සේරුවල මෙම යතුරු ලේඛක තනතුරු යටපත් කොට, ඒ හා සමාන සංඛ්‍යාවකින් කළමනාකරණ සහකාර තනතුරු ඇතුලත් කරමින් පිරිස්බල තක්සේරුව සංශෝධනය කර ගත යුතුය. එලෙස සංශෝධනය කර ගැනීමෙන් පසුව යතුරු ලේඛක තනතුරු වල සේවය කරනු ලබන සේවකයින් කළමනාකරණ සහකාර තනතුරට අන්තර්ග්‍රහණය කිරීම සඳහා පහත ලියවිලි කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස දන්වමි.

- ඇමුණුම - 01 වාර්තාව
- කොමිෂන් සභා අනුමත පත්වීම් ලිපිය
- අධ්‍යක්ෂ මණ්ඩල / කාරක සභා තීරණය
- යතුරු ලේඛක තනතුරෙහි ශ්‍රේණි උසස්වීම් ලබා තිබේ නම් එම උසස් කිරීමේ ලිපි

03. අන්නර්ග්‍රහනය සිදු කිරීමේදී යතුරු ලේඛක තනතුරෙහි දරමින් සිටින ශ්‍රේණිය හා වැටුප් පියවරට අනුරූපීව කළමනාකරණ සහකාර තනතුරේ අදාල ශ්‍රේණියේ හා වැටුප් පියවරේ තබනු ලැබේ.

04. 2/2010 , 2/2010 (i) , 2/2010 (ii) , 2/2010 (iii) යන සමූපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ අනුව නව තනතුරු නාම සඳහා අන්තර්ග්‍රහණය නොවූ වෙනත් අභාවිත තනතුරු, තවදුරටත් පවතී නම් , එම තනතුරු ද එකී චක්‍රලේඛ අනුව අන්තර්ග්‍රහණය විය යුතු බවට තවදුරටත් දන්වමි.

කොමිෂන් සභා නියමය පරිදි,

එල්.පී. මනෝජා එස්. පතිරණ
ලේකම් (වැ.බ.)
සමූපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත් :
1. ලේකම් පළාත් මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප. )- කා.දැ.ගැ.පි.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ත්‍රාර් (බ.ප.) - කා.දැ.ගැ.පි.